*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය*
*පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 191-206*
*ISSN 1800-1459*

# ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ ඉන්දියානු සාධකය සංකල්පගත වීම සහ එහි ක්‍රියාකාරීත්වය (1948-1977)

**ආර්. ඩී. ජයනෙත්ති**

*ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.*

**සාරාංශය**

ශ්‍රී ලංකාවට ආසන්නතම භූ ඒකකය ලෙස ඉන්දියානු අර්ධද්වීපය ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික සෑම අංශයක් කෙරෙහි ම බලපෑම් එල්ල කර තිබේ. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තමය තීරකයින් ඉන්දියානු සාධකය ඉතා සුපරික්ෂාකාරි ලෙස සංකල්පගත කර ගනිමින් පශ්චාත් විජිත රාජය ව්‍යුහය ගොඩනැගීමට උනන්දු වී ඇත. ඒ අතර ඉන්දියානු සාධකයට වඩාත් සංවේදී වන්නේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය යි. මෙම ලිපියේ මූලික ම අරමුණ වන්නේ 1948 නිදහස ලබාගත් තැන සිට 1977 වනතුරු ඉන්දියානු සාධකය ආරක්ෂක ප්‍රතිපත්තියට බලපෑම් කළ ආකාරය හඳුනා ගැනීම යි.

මෙම පර්යේෂණය මූලික වශයෙන් ම සාහිත්‍ය මූලාශ්‍රයන් මත පදනම් වෙයි. පර්යේෂණ ක්‍රමවේදයේ ප්‍රමුඛ අංගය වන්නේ ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රයන් හඳුනාගැනිමත් ඒවා විශ්ලේෂණය කිරීමත් ය. හැන්සාඩ් වාර්තා, පුවත්පත් ලිපි, සහ අනෙකුත් පරිපාලන වාර්තා ඇසුරෙන් ප්‍රාථමික දත්ත උකහා ගන්නා අතර එස්. යු කොඩිකාර, ඩී. එම් ප්‍රසාද් වැනි විද්වතුන්ගේ කෘති ඇසුරු කර නිසි නිගමනයක් කරා එළඹෙනු ඇත.

1948 සිට 1977 දක්වා පශ්චාත් විජිත ලංකාවේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය අධ්‍යයනය කරන විට පෙනී යන්නේ අදාළ අවධිය තුළ ඉන්දියානු සාධකය හඳුනා ගැනීම එක් පොදු තරංගයක් ඔස්සේ දිවයන බව යි. 1948-1977 දක්වා සමස්ත කාලය සලකා බලන විට ඉන්දියානු සාධකය සමඟ ගනුදෙනු කළ ආකාරය අදියර දෙකකි. එනම් 1948-1956 දක්වාත්, 1956 -1977 දක්වාත් කාල පරාසය යි. එම කාල පරාසයන් තුළ ඉන්දියානු සාධකය වෙනස් වෙනස් ආකාරයෙන් හඳුනාගත් අතර ඒ අනුව ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ විවිධ ප්‍රතිචාර දක්වමින් ඉන්දියාව සමඟ කටයුතු කළේ ය.

**කේන්ද්‍රීය වචන:** ඉන්දියානු භීතිය, පුරවැසි ගැටළුව, නොබැඳි ප්‍රතිපත්තිය, ඉන්දියානු සාගරීය සාම කලාපීය යෝජනාව

## හැඳින්වීම

පශ්චාත් විජිත ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තියේ හැඩගැසීම පිළිබඳ අධ්‍යයනය කරන විට එය යථාර්ථය හා තර්ජනය ප්‍රත්‍යක්ෂ කරගත් ආකාරය අනුව ඇති වන ආකල්ප සහ නිරූපණ මත පදනම් වූ සංකීර්ණ ක්‍රියාවලියක් ලෙස හඳුනාගත හැකිය. යථාර්ථය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට ගත් උත්සාහයේ දී විවිධ තත්ත්වයන් සහ සාධක ඊට බලපා ඇති අතර භූ උපායමාර්ගික සාධක, ඓතිහාසික අත්දැකීම්, එකල පාලන පංතියේ දේශපාලන දැක්ම සහ අභ්‍යන්තර අභියෝග ඒ අතරින් සුවිශේෂී වෙයි. මෙම

සාධක අතර ප්‍රස්තුත කාල පරාසයේ දී වඩාත් අවධානයට බඳුන් වූ ඉන්දියානු සාධකයට දුන් වැදගත්කම විමසීමට පෙර ජාතික ආරක්‍ෂාව යනු කුමක් ද යන්නට දී ඇති අර්ථකථන හඳුනාගත යුතු ය.

## ජාතික ආරක්‍ෂාව යනු

ගාමිණී කීරවැල්ල වැනි ශාස්ත්‍රඥයින් පෙන්වා දී ඇති අන්දමට නූතන ස්වාධිපත්‍ය රාජ්‍යයන් හැඩගැසුණු ආකාරය අනුව ජාතික ආරක්ෂාව යන සංකල්පය හඳුනා ගත යුතු ය. එහි දී ජාත්‍යන්තර දේශපාලන සන්දර්භය තුළ රාජ්‍යයේ ස්වාධිපත්‍ය හා දේශ සීමා අවුල් කළ හැකි රාජ්‍යයට වඩා බලවත් වූ අධිකාරීත්වයක් නැතැයි යන්න සලකා ගැණුනි. තම දේශ සීමාව තුළ රාජ්‍යය සුපිරි බලයක් ලෙස සැලකුණු අතර එක් රටක් අනෙකාගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම ප්‍රධාන රීතියක් විය. වියවුල් සහිත ජාත්‍යන්තර පරිසරයක ඉන් මිදීමට රාජ්‍යයට අවශ්‍ය යතුර ලෙස සලකා ගනු ලැබුවේ ජාතික ආරක්ෂාව යි. මේ අනුව සාම්ප්‍රදායික ජාතික ආරක්ෂක සංකල්පය තුළ මානව ඒකකයේ ආරක්ෂාවට වඩා රාජ්‍යයේ ආරක්ෂාව වැදගත් විය. රාජ්‍යයේ භෞමික අඛණ්ඩතාවට බාහිරින් වන තර්ජනවලින් ආරක්ෂා කර ගැනීමට වැඩි අවධානයක් යොමු වූ සාම්ප්‍රදායික ආරක්ෂක විග්‍රහයක් තුළ දේශපාලන හා හමුදාමය ආරක්ෂාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ අතර ආර්ථික ආරක්ෂාව වැනි අංග කෙරෙහි අවධානය අඩු විය (Keerawella, 2008: 9-10).

1948 නිදහස ලබා ගැනිමෙන් පසු ශ්‍රී ලංකාවේ පසු විපිත රාජ්‍ය ව්‍යුහය ගොඩනැගීමේ දී ආරක්ෂාවේ ඌනතාව යත් කෙරෙහි සංවේදී විය. සාම්ප්‍රදායික න්‍යායන් මත පිහිටමින් එහි දී ආරක්ෂාවේ ගැටළු සහගත තැන් රැසක් හඳුනා ගනු ලැබුණ අතර 1977 වන තුරු ම රාජ්‍යයට තර්ජනයක් විය හැකි අනාරක්ෂිත බවේ මූලයයන් රාජ්‍යයෙන් පිටත පිහිටි බවට සලකා ගැණුනි. එහි දී අභ්‍යන්තර තලය හා ගෝලීය තලයට වඩා කලාපීය තලය තුළ වන බලයන් වඩාත් අනතුරු දායක බව හඳුනා ගන්නා ලදී.

කලාපීය බලවතා වූ ඉන්දියාව මූලික ව ම අවධානය ලක් වූ නමුත් ලෝක තලයෙන් සමාජවාදී කඳවුර ද තර්ජනයක් එල්ල කළ හැකි මට්ටමක පවතින බව 1948 බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂය සලකා ගත්තේ ය. මේ නිසා බ්‍රිතාන්‍ය වැනි බාහිර බලයක පිහිට පැතීමට එම රජය යොමු විය. මෙයින් සිදු වූයේ ආරක්ෂක ප්‍රතිපත්තිය හා විදේශ ප්‍රතිපත්තිය අතර වූ පරතරය ඉතා තුනී වීමයි. කේ. ජේ. හොල්ස්ති (K.J. Holsti) වැනි විද්වතුන් පෙන්වා දෙන ආකාරයට මෙවැනි ප්‍රතිපත්ති සැකැස්මක දී රාජ්‍යයේ ඉහත කී හු ගෝලීය පිහිටීම දැඩි බලපෑමක් එල්ල කරයි. ඔහු පවසන්නේ ඕනෑ ම උපායමාර්ගික තෝරාගැනීමක් අගය කිරීමට අඩුම තරමේ විචල්‍යයන් සතරකට සහය දිය හැකි බව යි. පළමුවෙනි ව අන්තර්ජාතික පද්ධතියේ ව්‍යුහය යි. එහි නායකත්වය, ප්‍රමුඛතාව සහ ද්විතීකතාව මත පවතින රටාවන් එම ඒකකයේ කුඩා

කොටස්වල ක්‍රියාකාරකම්හි ස්වාධීනතාව මත්තේ යම්යම් සීමාවන් ඇති කරයි. රටකට ප්‍රතිවිරුද්ධ පද්ධතියක් තුළ හුදකලාව ඔවුන්ගේ අරමුණු සහ රුචිකත්වයන් ආරක්ෂා කර ගැනීමට නොහැකි ය. රටක පොදු විදේශ ප්‍රතිපත්තිමය උපායමාර්ග එහි දේශීයයන්ගේ ආකල්ප හා සමාජ ආර්ථික අවශ්‍යතා සමඟ බද්ධ වන්නේ ය. ප්‍රතිපත්ති සකසන්නන් ස්වකීය රුචිකත්වයන්ට අනුව බාහිර පරිසරය හා සම්බන්ධ ඔවුන්ගේ දිශානතීන් මත අඛණ්ඩ ව එල්ල වන පිටස්තර තර්ජනයන් සංජානනය කර ගන්නා තරාතිරම මත ද එය තීරණය වෙයි. රාජ්‍යයක භූගෝලීය පිහිටීම, භූමියේ ගතිලක්ෂණ සමඟ නිසඟයෙන් උරුම වූ ස්වාභාවික භූ උපක්‍රම ද ඔවුන්ගේ මෙම තීරණ හා බද්ධ වන බව පෙන්වා දෙයි (Holsti ,1983: 109).

මේ නිර්වචන අනුව විමසද්දී ඉන්දියන් සාගරයේ ලංකාවට ආසන්න ව ම පිහිටි භූ උපායමාර්ගික සාධකය ලෙස ඉන්දියාව කෙරෙහි ලංකාව ඉතාමත් ම සංවේදී ව කටයුතු කරනු දැකිය හැකි ය. ඉන්දියාවේ භූ භෞතික සුවිශාලත්වය සහ එහි බල හැකියාව මෙන් ම ඉන්දියාවේ තර්ජනාත්මක ස්වරූපය පිළිබඳ ලංකාවට පවතින ඓතිහාසික මතකය නිසාවෙන් ශ්‍රී ලංකාවේ ආරක්ෂක පර්යාවලෝකය තුළ ඉන්දියාව දැවැන්තයෙකු ලෙස සංකල්ප ගතකර ගන්නා ලදී. 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබාගත් පසු රාජ්‍ය ප්‍රතිපත්ති සැකැස්ම තුළ මෙම සංකල්පය අඛණ්ඩ ව පැමිණි අතර මෑතක දී දමිළ ඊළාම් අරගලයට දකුණු ඉන්දියාව ලබාදුන් සහයෝගයත් සමඟ එම සංකල්පය ජනවාර්ගික පදනමකින් යළිත් ඉස්මතු විය. මෙම ලිපිය තුළ විමසන්නේ 1948 සිට 1977 දක්වා රජයන්හි ජාතික ආරක්ෂක සංකල්පවලට ඉන්දියාව එල්ල කළ බලපෑම යි.

## පර්යේෂණ ගැටළු

1948 -1977 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩු වෙනස්වීමත් සමග ඉන්දියානු සාධකය හසුරුවා ගැනිමේ උපාය මාර්ගයන් වෙනස් වුයේ කෙසේ ද?

එම වෙනස් වන උපාය මාර්ග අනුව තත්කාලින ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියේ හැඩ ගැසීම සිදු වූයේ ද?

## අරමුණු

මෙම ලිපිය මූලික වශයෙන් ම ආරක්ෂක ප්‍රතිපත්ති අධ්‍යයනය කර යොමු වන නිසා එය ආරක්ෂක ක්ෂේත්‍රයට අදාළ වෙයි. ආරක්ෂක අධ්‍යයන ධාරාව හා බද්ධ වුවත් උපාය මාර්ගික වශයෙන් කලාපීය බලයක් හැසිරවීමට ගත් උත්සාහය ගැන විමසන නිසා මෙය උපාය මාර්ගික අධ්‍යයනයක් ලෙස ද වැදගත් වෙයි. පශ්චාත් යටත් විජිත ශ්‍රී ලාංකීය රාජ්‍යයෙහි ආරක්ෂක ප්‍රතිපත්තිය හැඩ ගැසීමට බලපෑම් කළ එක් ප්‍රධාන සාධකයක් වන ඉන්දියාව කෙරෙහි මූලික ව ම මෙහි දී අවධානය යොමු කරන්නේ ය. ඉන්දියාව සමඟ උපායශීලී ලෙස හැසිරෙමින් ඉන් තම රාජ්‍යයේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තීන්වලට එල්ලවන අවදානම අවම කිරීමට සෑම රජයක් ම උත්සාහ ගෙන තිබෙන නිසා මෙම අධ්‍යයනය 1948 - 1977 දක්වා අවධිය තෙක් සීමා කරමින් උක්ත

කාලයේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක පර්යාවලෝකය තුළ ඉන්දියානු සාධකය රඟ දැක්වූ භූමිකාව විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණකි. අදාළ කාල පරිච්ඡේදය තුළ ඉන්දියානු සාධකය සංකල්පගත කරගත් ආකාරය ප්‍රධාන කාලපරාස දෙකක් මත පදනම් ව විග්‍රහ කිරීමට අපේක්ෂිත ය.

1. 1948 - 1956 අවධිය
2. 1956 - 1977 අවධිය

ලිපියේ තවත් අරමුණක් වන්නේ මෙම ක්ෂේත්‍රය තුළ ප්‍රස්තුත කාලය පිළිබඳ අධ්‍යයනය කළ එස්. යූ. කොඩිකාර ඩී. එම්. ප්‍රසාද්, එච්. එස්. එස්. නිශ්ශංක වැනි විද්වතුන් ඉදිරියට ගෙන එන සංකථනය හඳුනාගනිමින් දැනට ඇති කරුණු මත නව අර්ථකථනයක් සංස්ථාපනය කිරීම යි. එම සංකථනය පිළිබඳ දළ අදහසක් ලබා ගැනීමට පහත සාහිත්‍ය විචාරය උපකාරී වෙයි. පොදුවේ ගත් කල මෙම යුගයේ වූ ලංකා ඉන්දියා සම්බන්ධය පිළිබඳ බොහෝ පර්යේෂණ කෘති රචනා කර ඇත. නමුත් ඒවායේ දී ආරක්ෂාව පිළිබඳ අඩු අවධානයක් යොමු කරන අතර විදේශ ප්‍රතිපත්තිය වැඩි අවධානයකට ලක් කරයි. ආරක්ෂක ප්‍රතිපත්තිය පිළිබඳ එස්. යූ කොඩිකාර තරමක් දුරට අවධානය යොමු කර ඇත. ඔහුගේ කෘති තුළ ඉන්දියාව හා ලංකාව අතර 1948 -1977 යුගයේ පැවති සබඳතාවේ ස්වරූපය පුළුල් ව අවධානයට ලක් කරන්නේ ය. නමුත් මෙම සාහිත්‍ය මූලාශ්‍රයවලින් ගොඩ නගන සංකථනයේ මූලික ම දුර්වලතාවක් වන්නේ එහි ඉතා සාම්ප්‍රදායික ලෙස ඉන්දියාව හා ලංකාව අතර පැවති උපාය මාර්ගික සබඳතාවන් අර්ථකථනය කර තිබීම යි. 1948- 56 යුගයේ එ. ජා. ප. තුළ පැවති ඉන්දියානු භීතිය හුවා දක්වන් රචකයෝ ඒ යුගයේ දී ඊට පසු යුගය තරම් ඉන්දු ලංකා ගැටළුව උණුසුම් නොවන බව හඳුනා නොගනිති. 1956 න් පසු ඉන්දු ලංකා සබඳතාව මිත්‍රත්වයකට පෙරළුණු බව පවසන මෙම කතුවරුන් එම සබඳතාව තුළ වූ සියුම්භාවය හෝ අන්‍යෝන්‍ය විරෝධී බව හඳුනා නොගත්තා අතර මෙම ලිපිය මගින් එය වෙනස් ආකාරයකට අර්ථකථනය කරනු ලබයි.

## ක්‍රමවේදය

මෙම ලිපිය මූලික වශයෙන් ම ලේඛනමය මූලාශ්‍රයන් අධ්‍යනය මත පදනම් වෙයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදයේ ප්‍රමුඛ අංගය වන්නේ ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රයන් හඳුනාගැනීමත් උචිත පරිදි එම මූලාශ්‍රයන් විශ්ලේෂණය කරමින් උපකල්පනයන් සංස්ථාපනය හෝ විස්ථාපනය කිරීමත් ය. හැන්සාඩ් වාර්තා, පුවත්පත් ලිපි, සහ අනෙකුත් පරිපාලන වාර්තා ඇසුරෙන් ප්‍රාථමික දත්ත උකහා ගන්නා අතර එස්.යූ. කොඩිකාර, ඩී.එම්. ප්‍රසාද් වැනි විද්වතුන්ගේ කෘති ඇසුරු කර දැනට පවතිනා සංකථනය හඳුනා ගැනුණි. එම පවතින සංකථනය මත පදනම් ව විද්‍යමාන කරුණුවලට නව අර්ථකථන ලබා දෙනු ලැබෙයි.

## ඉන්දියානු සාධකය සංකල්පගත වීම සහ එහි ක්‍රියාකාරීත්වය (1948 1956 දක්වා අවධිය)

1948 බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ රජයේ ජාතික ආරක්ෂක සංකල්ප තුළ ප්‍රධාන බාහිර තර්ජනය ලෙස හඳුනාගනු ලැබුණේ ඉන්දියාව යි. ඉන්දියාවට ආසන්න ව ශ්‍රී ලංකාවේ පිහිටීම මෙන් ම නැගී එන ජාතික රාජ්‍යයක් ලෙස ඉන්දියාව වර්ධනය කරගනිමින් තිබූ යුද ශක්තියත් මෙම සංකල්පය ඇතිවීමට තුඩු දුන්නේ ය. 1947 වන විට ඉන්දියානු හමුදා සෙබළුන් බ්‍රිතාන්‍ය හමුදා ඛණ්ඩ යටතේ තුන්ලක්ෂයකට වඩා සේවය කළ අතර ඉන්පසු අපූර්වාකාරයෙන් එම සෙබළ පිරිස් ගණනින් වර්ධනය විය (Keerawella, 1992: 424) පාබල, ගුවන්, නාවික යන ත්‍රිවිධ හමුදාව ම ගොඩනැගීම අතින් ඉන්දියාව දැවැන්ත සාර්ථකත්වයක් ලැබුවා ය. මෙම වර්ධනය ශ්‍රී ලංකාවට පමණක් නොව දකුණු ආසියානු කලාපයේ සෑම රටකට ම පාහේ අදෘශ්‍යමාන තර්ජනයක් විය. 1955 වන විට ඉන්දියාවේ මෙම වර්ධනය සංසන්දනාත්මක ව විමසා බලන Defence and security in the Indian ocean area (1958) නම් ග්‍රන්ථය ලංකාව ද දත්ත ගොනු අතරට ඇතුළත් කර ඇත්තේ අසල්වාසීන් දෙදෙනා අතර වූ අසමාන හමුදා ගොඩනැගීම යම් ආක්‍රමණික අභිලාෂයක දී කෙතරම් පහසු ජයක් අත්කර දෙන්නේ දැයි පහදාලමිනි.

**වගු අංක 1: 1955 වන විට ඉන්දියා හා ලංකා හමුදා තත්ත්ව සංසන්දනයකි.**

| | ඉන්දීය සාගර කලාපීය හමුදා ප්‍රබලතාව ( ඉන්දියානු උපමහද්වීපය ආශ්‍රිත ව) | | | |
|---|---|---|---|---|
| | පාබල හමුදා | නාවික හමුදා | ගුවන් හමුදා | විශේෂ අංග |
| ලංකාව | ස්වාධීන සේනාංකයක් ලෙස සංවිධානය කළ 3000 5000 අතර පිරිසක් | සංකේත හමුදාවක් පමණි | සංකේත හමුදාවක් පමණි | නැත. |
| ඉන්දියාව | සන්නද්ධ රථ කණ්ඩායම් දෙකක් ද පාබල හමුදා කණ්ඩායම් දහයක් ද සහිතව 300,000 500,000 තරම් ප්‍රමාණයක් වේ. මෙයට අමතරව සහ ප්‍රාදේශීය හමුදා කණ්ඩායම් ද අන්තර්ගතය. | අධිවේගී ක්‍රෑසස් නම් යුද නැව් දෙකක්ද, ඩිස්ට්‍රෝයර් යුද නැව් සහ ප්‍රහාරක යුද නැව් 15 20 ක්ද, කුඩා යාත්‍රා 40 50 ක්ද ඇතුළත් මෙම හමුදා ඒක්කයට බෝම්බායේ නැව් තටාංගනයක් පැවතියේය. ස්කෝඩ්රනයන් (Squadrons Flying boats) තුනක් ඔවුන් සතු විය. | ජෙට් ප්‍රහාරක විශේෂ 15 20 විය. බෝම්බ සහ නාවික ප්‍රදේශ සෝදිසිකිරීම් යටතේ විශේෂ ඒකක දහයක් විය. ප්‍රවාහන ඒකක පහකි. බැංග්ලෝරයට ගුවන් යානා රැස් කරන ලද අතරගුවන් නියමුවන්ගේ අමතර සහායකයින් සහ ප්‍රවාහන ගුවන් යානා සිවිල් ගුවන් ප්‍රවීණයන් වෙත නිතරම පවත්වා ගැනිණ. | ඉන්දියානුහමුදා දක්ෂකම හා නිර්භීතභාවය අතින් i හා ii ලෝක යුද්ධවලදී ඉහළ වාර්තාවක් තබා තිබුණි. දකුණු ඉන්දියාවේ බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කර ස්ථාපිත කළ ආරක්ෂක නිෂ්පාදනාගාර වේ.ඉන්දියානු කර්මාන්තද හමුදාමය ස්වයංපෝෂිත බව උදෙසා මෙහෙයවනු ලබයි. |

සන්නද්ධ රථ කණ්ඩායම් දෙකක් ද පාබල හමුදා කණ්ඩායම් දහයක් ද සහිත ව 300,000 - 500,000 තරම් ප්‍රමාණයක් වේ. මෙයට අමතර ව සහ ප්‍රාදේශීය හමුදා කණ්ඩායම් ද අන්තර්ගත ය. අධිවේගී ක්රූසස් නම් යුද නැව් දෙකක් ද, ඩිස්ට්‍රෝයර් යුද නැව් සහ ප්‍රහාරක යුද නැව් 15-20 ක්ද, කුඩා යාත්‍රා 40-50 ක් ද ඇතුළත් මෙම හමුදා එක්කයට බෝම්බායේ නැව් තටාංගණයක් පැවතියේ ය. ස්කෝවොඩරනයන් (Squadrons Flying Boats) තුනක් ඔවුනු සතු වූහ (වගු අංක 1).

ජෙට් ප්‍රහාරක විශේෂ 15-20 විය. බෝම්බ සහ නාවික ප්‍රදේශ සෝදිසි කිරීම් යටතේ විශේෂ ඒකක දහයක් විය. ප්‍රවාහන ඒකක පහකි. බැංග්ලෝරයට ගුවන් යානා රැස් කරන ලද අතර ගුවන් නියමුවන්ගේ අමතර සහායකයින් සහ ප්‍රවාහන ගුවන් යානා සිවිල් ගුවන් ප්‍රවීණයන් වෙත නිතර ම පවත්වා ගැනිණ. ඉන්දියානු හමුදා දක්ෂකම හා නිර්භීතභාවය අතින් i හා ii ලෝක යුද්ධවල දී ඉහළ වාර්තාවක් තබා තිබුණි. දකුණු ඉන්දියාවේ බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කර ස්ථාපිත කළ ආරක්ෂක නිෂ්පාදනාගාර වේ. ඉන්දියානු කර්මාන්ත ද හමුදාමය ස්වයංපෝෂිත බව උදෙසා මෙහෙයවනු ලබයි. (A Study group of the Indian Council of World affairs, 1958).

එමෙන් ම නිදහස ලැබූ මුල් කාලයේ සිට ම ශ්‍රී ලංකාවට ගැටළු කිහිපයක් විය. ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර නොවිසඳුණු සමුද්‍ර දේශ සීමා ගැටළුවක් පෝක් සමුද්‍ර සන්ධිය ආශ්‍රිත ව පැන නැගී තිබුණි. එසේ ම ඉන්දියානු සම්භවයක් ඇති සංක්‍රමණික කම්කරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ ගැටළුව ද මේ වන විට උණුසුම්වෙමින් පැවතිණි. දකුණු ඉන්දීය ජනතාවට පුරවැසිභාවය ලබාදීම පිළිබඳ ව සිංහල නායකයන් තුළ එතරම් ප්‍රසාදයක් නො පැවතුණි (Prasad, 1973: 307).

ඉන්දියාවට ද ශ්‍රී ලංකාව මූලික ගැටළුවක් විය. ඉන්දියාව දකුණු ආසියානු කලාපය තුළ භූගෝලීයමය අතින් අද්විතීය වුව ද ඇයට පහරදිය හැකි මර්මස්ථානයක් වී නම් ඒ ශ්‍රී ලංකාව යි. ශ්‍රී ලංකාව ඉන්දියාවට තර්ජනයක් විය හැකි සතුරු පාර්ශ්වයන් සමඟ එක්වූයේ නම් එය සිය ජාතික ආරක්ෂාවට තර්ජනයක් නිසා ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරකම් කෙරෙහි ඉන්දියාව සැකයෙන් පසුවූවා ය. මේ නිසා 1940 දශකයේ අගභාගයේ දී ශ්‍රී ලංකාව ඉන්දියාවේ දේශපාලන ව්‍යූහයේ ඓන්ද්‍රිය කොටසක් බවට පත්කර ගැනීමේ මතවාදයක් ඉස්මතු විය. ශ්‍රී ලංකාව ඉතා ඉක්මනින් ඉන්දියාවේ ඓන්ද්‍රිය කොටස් වනු ඇති බවට 1949 පැවසූ ඉන්දියානු ජාතික සංගමයේ සභාපතිවරයා පහත අදහස පළ කර සිටියේ ය.

"ඉන්දියාවට සහ ශ්‍රී ලංකාවට පොදු උපායමාර්ගිකත්වයක්, පොදු ආරක්ෂක ප්‍රබලතාවක් සහ පොදු ආරක්ෂක උපක්‍රම තිබිය යුතු ය. ශ්‍රී ලංකාව ඉන්දියාව මිත්‍රත්වයෙන් නොසිටින පිරිසක් හා මිත්‍ර ව සිටින තුරු එය විය නොහැකි ය. ශ්‍රී ලංකාවට තමන්ගේ ම සංවිධානය බැඳීමට හෝ එසේ සාමාජිකත්වය ලැබූ බව ප්‍රකාශ කිරීමට අයිතියක්

නැත. නමුත් ලොව සතුරු දෙපිරිසක් සිටී ද ශ්‍රී ලංකාව හා ඉන්දියාව එම දෙපිරිසෙන් එක පැත්තක බැඳී එකම කණ්ඩායම සමඟ නොසිටින්නේ ද එය දෙපාර්ශ්වයටම ඉතා නරක දිනයක් වනු ඇත"(Kodikara, 1982: 23).

නිදහස ලැබීමට පෙර හතළිහ දශකයේ මැද ඉන්දියාව හා බුරුමය ශ්‍රී ලංකාව එක්වූ ඉන්දියානු සංගතියක් ඇති කිරීමේ වැදගත්කම පනික්කාර් වැනි විද්වතුන් පෙන්වා දී තිබූ අතර නේරු වැනි දේශපාලඥයන් පවා මුල දී එම මතයට නැඹුරුවක් දැක් වූ බව පෙනෙයි (Wriggins, 1962: 399). ඉන්දියාව, ශ්‍රී ලංකාව හා බුරුමය යන රටවල් තුන උපායමාර්ගික ඒකකයක් ලෙස පවත්වාගෙන යාම ඉන්දියාවේ ආරක්ෂක ප්‍රතිපත්තියට සුහදායි බව 1945 දී පනික්කාර් පෙන්වා දී තිබේ (Panikkar, 1945: 95).

මෙම ප්‍රකාශන ආදියෙන් ඉන්දියාවෙන් තර්ජනයක් එල්ල වෙතැයි යන මායාවක් ශ්‍රී ලංකාව තුළ ගොඩනගා තහවුරු කිරීමට ලාංකික නායකයින්ට අවස්ථාවක් ලැබුණි. අයිවර් ජෙනිංග්ස් මහතා වරක් පෙන්වා දුන්නේ ඉන්දියාව ශ්‍රී ලංකාවට කෙතරම් සංස්කෘතික ආගමික සමීප බවක් පැවතිය ද එයින් කවර මොහොතක හෝ භීම ධාවකයක් පැමිණිය හැකි බව යි.

"ආසන්නයේ දස ලක්ෂ තුන්සිය පණහක ජනගහණයක් ඇති රටක් තිබීම තුළ නොපෙනෙන අර්ථය ඩී. එස්. සේනානායකයන් දැන ගෙන සිටියේ ය. මෙම ජනයා ලංකාවේ ජනයාගේ ජීවන තත්ත්වයට වඩා පහත් ව රටින් පිටතට යන ලෙසින් විසිර සිටිති. වැරදි උපදෙස් දෙන නායකයෙකු එහි වේ නම් ජනතාව ආක්‍රමණයකට පෙළඹෙනු ඇත"(Jenings, 1956: 32).

මෙවැනි මතයක් 1956 බිඳවැටෙන තුරු ම එක්සත් ජාතික පක්ෂය තුළ පැවති බව 1954 දී ජෝන් කොතලාවල මහතා දැක් වූ පහත අදහස ද අනුව පෙනී යයි.

"පණ්ඩිත් නේරුතුමාට අපි ගෞරව කරමු. එතුමාට ආදරය කරමු. මනුෂ්‍යයෝ මරණයට පත්වන්නාහ. දැනට යන්නාක් මෙන් දකුණු ඉන්දියාව කොමියුනිස්ට් පාලනයක් අතට ගියොත් ඔවුහු අප ව ආක්‍රමණය කරති "(Hansard's, 1954: .51-52).

මෙම ප්‍රකාශන විමර්ශනය කර බැලීමේ දී පෙනී යන්නේ ඉන්දියාව ශ්‍රී ලංකාවට ආක්‍රමණයක් එල්ලකරාවී යන සංකල්පය ඉස්මතු කරමින් බාහිරින් එන හමුදා තර්ජනයකින් ආරක්ෂාවීමට ගන්නා උත්සහයක් ලෙස ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සකස්කරගත් බව යි. ඒ කෙරෙන් අරමුණු කර ගත්තේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීම යි.

1948-1956 දක්වා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ එළඹුණු තීරණ විමසන විට ඉන්දියානු තර්ජනය මතුපිටට ගෙන එමින් එළඹුණු ඇතැම් තීරණයන් සාධාරණීකරණය කළ බව පෙනී යයි. එවැනි එක් අවස්ථාවක් වන්නේ 1947 බ්‍රිතාන්‍යයන් සමඟ ආරක්ෂක ගිවිසුමකට එළඹීම යි. එක් අතකින් මෙම ගිවිසුම හරහා බ්‍රිතාන්‍යයේ සහයෝගීතාව ඇති ව ඉන්දියාවට රිදවන ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව අනුගමනය කළේ ය. අනික් අතින් 1947 ආරක්ෂක ගිවිසුමට එළඹීමේ දී ඩී. එස්. සේනානායකට එල්ල වූ බ්‍රිතාන්‍ය ගැති යැයි යන චෝදනාවෙන් අත්මිදීම සඳහා නිදහසට කරුණක් ලෙස ඉන්දියානු තර්ජනය යොදාගත්තේ ය. 1951 වන විට ද ආරක්ෂාවේ ඌනතාවක් ගැන පවසමින් එය සමනය කිරීමට අවශ්‍ය බ්‍රිතාන්‍ය සහයේ වැදගත්කම තවදුරටත් අවධාරණය කරමින් පැවතුණි.

"වර්තමාන මොහොත වන විට බ්‍රිතාන්‍ය වැනි බලයක් මිත්‍රත්වයෙන් සිටීමෙන් අපගේ යහපත් අනාගතය ගැන ස්වල්ප සැකයක් වුව නැත. ඔවුන්ගේ මිත්‍රත්වය අපගේ විශිෂ්ටතම ආරක්ෂාව යි "(Mendis, 1983: 368).

මෙලෙස ඉන්දියාවේ තර්ජනයක් ලෙස සලකමින් බාහිර බලයකින් ආරක්ෂාව පැතූ එකම රට ශ්‍රී ලංකාව නොවේ. පාකිස්ථානයත් අනිකුත් ඉස්ලාම් රටවල් හා ගිවිසුම්වලට එළඹුණේ ද ඇමරිකාව සමඟ සමීප සබඳතා පවත්වා ගත්තේ ද මේ යෝධ අසල්වැසියා නිසා ය. මෙලෙස ඉන්දියාවට එරෙහි පවුරක් ගොඩනගමින් ඉන්දියාව සමඟ ආරක්ෂිත ව ගනුදෙනු කරන්නේ කෙසේ ද යන්නට පිළිතුරු සැපයීමට උත්සාහ දැරුව ද 1956 වන තුරු දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ ඉන්දියාවට එරෙහි ව ක්‍රියාකාරී ලෙස ඉදිරිපත් වීමට ලංකා රජය උත්සාහ නොකිරීම යි. ඒ වෙනුවට සේනානායක රජය කළේ ඉන්දියාව සමඟ කලාපීය මිත්‍රත්වය තහවුරු කර ගනිමින් සහයෝගී ව කටයුතු කිරීම යි. වරක් ඩී. එස්. සේනානායක පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළේ මෙම දිගුකල් පවතින නොරිස්සුම් සහගත මතභේදය, භූගෝලීය සංස්කෘතිය හා ඉතිහාසය දක්වනු පරිදි, සියලු දෙනා අනුමත කරන රටවල් දෙක අතර වර්ධනය වන මිත්‍රශීලී සහයෝගීතා සම්බන්ධයකට පැමිණ තිබෙන බව යි (Hansard's, 1952: 295). හුවා දක්වන ලද ඉන්දියානු තර්ජනය හුදු කතාවන්වලට පමණක් සීමා වූ අතර රජයේ ප්‍රතිපත්තිවල දී රජය නම්‍යශීලී බවක් දැරී ය.

මෙම සම්බන්ධතාවන් ඔස්සේ සාකච්ඡා මඟින් ශ්‍රී ලංකාව විසඳා ගැනීමට උත්සාහ දැරූ මූලික ම ගැටළුවක් වූයේ ඉන්දු ලංකා පුරවැසි ගැටළුව යි. බ්‍රිතාන්‍ය යුගයේ දී ඉන්දීය දමිළ කම්කරුවන් ලංකාවට සංක්‍රමණය වූ අතර නිදහස ලබන විට මෙම කම්කරුවන්ට ලංකාවේ පුරවැසි බව ලබා දෙන්නේ ද නැතිනම් ඉන්දියාවට යළි පිටත්කර යවන්නේ ද යන ගැටළුව අග්‍රාමාත්‍යවරයා හමුවේ විය. මෙම පුරවැසි ප්‍රශ්නය දේශපාලන ගැටළුවක් බවට පත්වූයේ සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමේ දී ඉන්දියානු කම්කරු පිරිස ඇතුළත් කරගන්නේ ද යන පැනය මත යි. 1941 දී ඉන්දියාව සමඟ පුරවැසිභාවය ලබාදෙන්නේ ද යන ගැටළුවට විසඳුම් සෙවීමට

සාකච්ඡා ආරම්භ කළ නමුත් එය අසාර්ථක විය. 1947 දී යළිත් නේරු සේනානායක සාකච්ඡා ඇති වූ අතර එය යම් මට්ටමක සාර්ථකත්වයකින් පවත්වාගෙන ගිය ද සම්පූර්ණ සාර්ථකත්වයක් නො ලැබුණි. නැවත නැවත ඇති වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස 1948 - 1949 පුරවැසි පණත ඇති වූ අතර එහි වූ දුර්වලතාවක් වූයේ සිතූ වේගයෙන් පණත ක්‍රියාවේ යෙදිය නොහැකි වීම යි. ඉන්දියාව එක් අතකින් ලංකාවට චෝදනා කරමින් කීවේ මෙම කම්කරු ගැටළුව පිළිබඳ මානුෂික දෘෂ්ටියක් ශ්‍රී ලංකාව නොහෙළන බව යි. 1953 දී නේරු කළ එක් කතාවකින් මේ පිටුපස ඉතිහාසයක් ඇති බවත් ඒ ඉතිහාසය නිසා ශ්‍රී ලංකා රජයට කම්කරුවන් කිසිකෙනෙක් රැක බලා නොගන්නා බව පැවසීමට නොහැකි වන අතර ලක්ෂයක දෙලක්ෂයක ජනයා විසිකර දැමිය නොහැකි බවත් පැවසී ය (Phadnis, 1992 :710).

මේ සියලු සාකච්ඡා සාර්ථකත්වය කරා ළඟා නොවුණු බැවින් ඉන්දියාවේ දැඩි ප්‍රතිපත්තිය හමුවේ ඉන්දු ලංකා පුරවැසි ගැටළුවට විසඳුම් සෙවීමට ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියේ එක් දුෂ්කර ඉලක්කයක් විය. ඉන්දියාව සමඟ හොඳහිත හා සහයෝගීතාව සුරක්ෂිත කර ගැනීමට ශ්‍රී ලංකාව මේ වන විට පෙළඹී සිටි නිසා ඉන්දියාවට ඍජු ව විරුද්ධ වීමට ශ්‍රී ලංකාවට නොහැකි වූ අතර දැඩි සේ බටහිර ගැති යැයි චෝදනා ලැබූ ජෝන් කොතලාවල මහතා පවා ඉන්දියාවේ ඇතැම් බලපෑම්වලට හිස නැමූ බව පෙනෙයි. මේ අවස්ථාව ඉස්මතු වූයේ 1954 දී ඇමරිකා එක්සත් ජනපදය මැදිහත් වී CENTO හා SEATO සංවිධාන මැදපෙරදිග හා ආසියානු රටවල්වල සහය ඇති ව ඇතිකිරීමට තැත් කිරීමෙනි. SEATO (South Asian Treaty Organization) සංවිධානයට ශ්‍රී ලංකාව බඳවා ගැනීමට ඇමරිකාව උනන්දුවක් දැක්වුව ද ජෝන් කොතලාවල මහතා මෙහි දී උභතෝකෝටිකයකට මුහුණ දුන්නේ ඉන්දියාව මුල සිට ම එයට විරුද්ධතාව පළ කළ නිසාවෙනි' SEATO සංවිධානය බඳු සංවිධානයක් වැරදි බව පමණක් නොව එය ඕනෑ ම ආසියානු රටකට අනතුරුදායක බව නේරු ප්‍රකාශ කළේය(Brissendon, 1962: 205). මේ විරුද්ධතාව නිසා කොළඹ බලවතුන් දිගින් දිගට ම රැස්වී සාකච්ඡා කරමින් SEATO පිළිබඳ තීරණයක් ගැනීමට යුහුසුළු වූ නමුත් අවසානයේ ඉන්දියාවේ මතය ජය ගත්තේය. දැඩි බටහිර පක්ෂපාතීත්වයක් ඇතැයි කියූ ජෝන් කොතලාවල මහතා ද මෙහි දී SEATO වෙත නොබැඳෙන බවට තීරණය කළ අතර ඔහු අවසානයේ දී ප්‍රකාශ කළේ SEATO සඳහා යෝජනා කිරීම බටහිර ගිය වැරදි මඟක් බව යි (Hansard's, 1954: 36).

මෙලෙස ඉන්දියානු විරෝධය නිසා බාහිර බලවතුන් සමඟ සංවිධානවලට එළඹීමෙන් ලංකාව වැලකුණ ද ඉන්දියාව මූලිකත්වය ගත් කලාපීය සහයෝගීතා සංවිධානවල ක්‍රියාකාරී වැඩ කොටසක් ශ්‍රී ලංකාව ඉටු කළේ ය. 1947 නවදිල්ලියේ දී කැඳවූ ආසියානු සබඳතා සම්මේලනය මගින් ආසියානු සහයෝගීතාව ඇරඹුණු අතර ශ්‍රී ලංකාව මැදිහත් වී ආරම්භ කළ කොළඹ සැලසුම සහ කොළඹ බලවතුන්ගේ සම්මේලනය ආදිය මෙම සහයෝගීතා සංකල්පය තවත් වර්ධනය කළේ ය (Jayasekara, 1992: 267).

මෙලෙස සහයෝගීතාව වර්ධනය කරගනිමින් ද තවත් වරෙක කලාපයෙන් පිටත බලවතුන්ගේ උදව්වෙන් ඉන්දියාවේ බලය සමතුලනය කරමින් ද එක්සත් ජාතික පක්ෂ නායකයින් 1956 වන තුරු උත්සාහ කළේ ඉන්දියාව හසුරුවන්නේ කෙසේ ද යන ගැටළුවට විසඳුමක් සෙවීමට යි. එය වරෙක ජාතික ආරක්ෂාවට එල්ලවන ප්‍රමුඛ ම බාහිර තර්ජනය ලෙස හුවා දක්වමින් ශ්‍රී ලංකාවේ නායකයන් එළඹුණ බොහෝ තීරණ සාධාරණීකරණය කිරීමට විසඳුමක් ලෙස ද යොදාගැණුනි. නමුත් මේ පිළිබඳ ව රචනා කර ඇති බෙහෝ විද්වතුන් සම්ප්‍රදායික ව පෙන්වා දෙන තරම් දැඩි ඉන්ද්‍ර විරෝධී ප්‍රතිපත්තියක් ලංකා රජය ගෙන ගියේ නැත. ඉන්ද්‍ර විරෝධය වචනාර්ථයට පමණක් සීමා විය. 1956 එක්සත් ජාතික පක්ෂ රජය බිඳවැටීමෙන් පසු ඉන්දියාව සමඟ ගනුදෙනු කරන ආකාරයේ සහ ඉන්ද්‍ර ලංකා සබඳතාව නව රජය විසින් හඳුන්වා දෙන ආකාරයේ යම් වෙනසක් ඇති වුව ද ඉන්දියාව නිසි ලෙස හසුරුවා ගනිමින් එහි බලපෑම අවම කළ යුතු ය යන ආකල්පයේ වෙනසක් නොවුණි.

## 1956 -1977 අතර අවධිය

1956 මහජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණය සමඟ ඉන්දියාව සමඟ පෙර තිබූ දෘඩ බව ක්‍රමයෙන් වෙනස් අතකට හැරුණි. එසේ වුවත් ආරක්ෂාව පිළිබඳ සලකා ගැනීම් තුළ ඉන්දියාව තවදුරටත් ප්‍රමුඛ සාධකයක් වූ අතර වෙනස් වූයේ ඉන්දියාව තර්ජනයක් ලෙස සංජානනය කර ගැනීමේ විලාසය පමණි. බණ්ඩාරනායක මහතා අග්‍රමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති නව සංකල්පයන් මත පෙළගැසුණේ ය. ඒ සංකල්පයන් වූයේ නොබැඳි බව හා මධ්‍යස්ථ බව යි. මේ නොබැඳි බව හා මධ්‍යස්ථ බව මගින් කලාපීය සහයෝගීතාව තහවුරු කර ගැනීමත් පිටස්තර බල කඳවුරුවලට නොබැඳී සිටීමටත් උත්සාහ දැරුණි. බණ්ඩාරනායක හා නේරු යන දෙදෙනා ම නොබැඳි සංකල්පය ආසියානු රටවල් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාකාරී දායකත්වයක් දැක්වූහ. බණ්ඩාරනායක ඉන්දියාව සමඟ එකඟතාවක් පවත්වා ගත යුතු යැයි සලකා ගනු ලැබූයේ 1956 බලයට පැමිණීමට පෙර සිට ම බව 1952 දී ඔහු කළ ප්‍රකාශයකින් පෙනෙයි.

"අපගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අප අතර සහ ඊසාන දිශාවේ අප අසල්වැසියන් සමඟ එකඟතාවක් ඇති කරන ක්‍රියාදාමයන් පෝෂණය කළ යුතු වෙයි. ආරක්ෂක තත්ත්වය හා උපක්‍රමික තත්ත්වය ගැන බලන කල්හි කවර අංශයකින් වුව ද ඉන්දීය සයුර වූ කලී දකුණු ආසියාවේ සංවිධානය කළ ආරක්ෂක සැලසුම්වල පදනම වෙයි"(Hansard's Parlimentary Debates, 1952: 80).

1956 පසු තුන්වන ලොව රටවල හමාගිය නොබැඳි බවේ රැල්ල සහ කලාපීය සහයෝගීතාවේ වැදගත්කම හුදු සංකල්පීයමය සංවර්ධනයක් ලෙස අපට හඳුනාගත නොහැකි ය. එක් අතකින් එය නවක රටවල් තමන් පශ්චාත් විජිත රාජ්‍ය සැකැස්ම තුළ මුහුණ දෙන බොහෝ ගැටළු නිරාකරණය කර ගැනීමට ක්‍රියාත්මක කළ නවතම

උපාය මාර්ගයක් වූයේ ය. අනිත් අතින් නොබැඳි බව සීතල යුද්ධ බල රාමුව තුළ කඳවුරුවාදය ප්‍රතික්ෂේප කිරීමට ඇති එකම විකල්පය විය. බණ්ඩාරනායක ලංකාවේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියට හඳුන්වාදෙන මෙම නොබැඳි බව හා කලාපීය සහයෝගීතාව ඉන්දියාව සමඟ ගනුදෙනු කිරීමේ ද නවතම මුහුණුවර ලෙස අපට හඳුන්වාදිය හැකි ය. එම ක්‍රියාවලියේ දී ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන දෙදෙනාට ම තිබුණේ එක සමාන අරමුණු යි. එම අරමුණු කේ. පී. හොල්ස්තිගේ පහත ප්‍රකාශයෙන් පෙනී යයි.

"නූතන ජාත්‍යන්තර සංදර්භය තුළ නොබැඳි උපායමාර්ගයන් බොහෝ විට යුදමය ප්‍රශ්නවලට සීමා කර ඇත. නමුත් නොබැඳි යැයි කියා ගන්නා රටවල් අනෙකුත් ගැටළුවල දී බොහෝ දුරට තාවකාලික සන්ධාන පිහිටුවා ගනී. ඔවුන්ට පොදු අරමුණු පවතී. එනම් අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර සහ කාර්මික රටවල් සමඟ කරන වෙළඳමේ වැඩි ලාභයක් ලබාගැනීමට තැත් කිරීම ආදිය යි "(Holsti, 1983: 114).

මෙලෙස නොබැඳි බවේ තරංගය ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියට ද බලපෑම් කළ අතර ඉන්දියාව පෙරට වඩා එහි කේන්ද්‍රීය බවක් ඉසුලුවේ ය. වරක් බණ්ඩාරනායක ප්‍රකාශ කළේ ලන්ඩන් හා වොෂින්ටන්වලට වඩා හොඳ විකල්පයක් ලෙස නවදිල්ලිය ශ්‍රී ලංකාවේ අනාගත ක්‍රියාමාර්ගවල කේන්ද්‍රය බවට පත්වන බව යි (Ceylon Daily News , 23 April, 1956: 3).

එසේම නේරු හා බණ්ඩාරනායක යන දෙදෙනා ම සෝවියට් දේශය යටත්විජිත බලයක් ලෙස නොසැලකුවේ ය. සූවස් හංගේරියන් අර්බුදවල දී මේ දෙරට ම කලාපීය නායකයින් ලෙස එකඟතාවක් ඇති ව කටයුතු කළේ ය. දෙරටට බලපාන අන්‍යොන්‍ය ගැටළුවල දී විසඳුම් සෙවීම ඉහත සහයෝගීතාව නිසා පෙරට වඩා පහසුවක් විය. විශේෂයෙන් ඒ මගින් ඉන්දු ලංකා පුරවැසි ගැටළුවට විසඳුමක් සෙවීමට බණ්ඩාරනායක අදහස් කළ අතර 1954 දී දුන් විසඳුම් ඔහුගේ අගය කිරීමට ලක් නොවුණි. බණ්ඩාරනායක ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය හඳුන්වාදුන් මෙම නවක මිත්‍රත්වය තුළින් ඔහු අපේක්ෂා කළේ ඉන්දියාව ඉතා උපක්‍රමශීලීව හීලෑ කරගනිමින් එය හසුරුවා ගැනීම යි. මෙම නව සංකල්පය ක්‍රියාත්මක ආකාරයෙන් ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය තුළට ඇතුළත් කළේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසිනි. ඇයගේ දෙවන පදවි ප්‍රාප්තියෙන් පසු එනම් 1970 සමඟි පෙරමුණ ආණ්ඩුව බලයට පැමිණි තැන් සිට ඉන්දියාව සමඟ ගනුදෙනු කිරීමේ තීව්‍රතාව ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. එක් අතෙකින් මෙකල ඉන්දියාවේ මිත්‍රත්වය දෙසට තම හස්තය දිගු කරන ශ්‍රී ලංකාව අනික් අතින් ඉන්දියාව හැසිරවීම සඳහා ක්‍රියාකාරී ලෙස කටයුතු කළේ ය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ ඉන්දියාව සම්බන්ධයෙන් සාර්ථකත්වයක් ලබාදුන් එක් අවස්ථාවක් වූයේ 1964 සිරිමා ශාස්ත්‍රි ගිවිසුම හරහා ඉන්දු ලංකා පුරවැසි ගැටළුවට විසඳුමක් සෙවීම යි. ඇත්තෙන් ම මෙම ගිවිසුමේ දී එකඟ වූ පරිදි පුරවැසිභාවය ලබාදීම අඛණ්ඩ ව සිදු වූවා නම් එය පැවති ගැටළුවට

සාර්ථක විසඳුමක් වනු ඇත. නමුත් සිදුවූයේ 1965 දී ශ්‍රී. ල. නි. ප. බිඳ වැටී එ. ජා. ප. ය බලයට පැමිණි පසු ඩඩ්ලි සේනානායක මෙම ගිවිසුම කෙරෙහි ඇල්මැරුණු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම යි. එකල එයින් සිතූ තරම් ප්‍රතිඵල නො ලැබුණි. එය පහත වගුවෙන් පෙනෙයි (වගු අංක 2).

**වගු අංක 2: ඉන්දියානු කම්කරුවන් වර්ෂයක් පාසා ආපසු යැවීමේ ප්‍රගතිය**

| වර්ෂය | ආපසු යැවූ සංඛ්‍යාව |
|---|---|
| 1964 | 14 |
| 1965 | 512 |
| 1966 | 1910 |
| 1967 | 2648 |
| 1968 | 2123 |
| 1969 | 5248 |
| 1970 | 8733 |
| 1971 | 21867 |
| 1972 | 2575 |
| 1973 | 3172 |
| 1974 ජනවාරි | 2585 |
| මුළු එකතුව | 1,06,423 |

(ජාතික රාජ්‍ය සභා නිල වාර්තාව, කාණ්ඩ අංක 10, කලාපය 3, 1974 පෙබරවාරි 21, තීරු අංක 360.)

තරමක් දුරට ගිවිසුම සාර්ථක වූ නිසා එය ඉන්දියාව සමඟ සමගි පෙරමුණු රජය පවත්වාගෙන ගිය යහපත් සබඳතාවට නිදසුනකි. එසේ ම කච්චතිව් දූපත ආශ්‍රිත ව පැවති සමුද්‍ර දේශසීමා ගැටළුව නිරාකරණය කර ගැනීමට ද මැතිනියට අවස්ථාව ලැබුණි. මෙම දේශසීමා ගැටළුව සෘජු ව ම ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට බලපා ආර්ථික අනාරක්ෂිත බවක් ඇතිකර තිබුණි. 1974 දී අත්සන් කරනු ලැබූ සමුද්‍ර දේශසීමා ගිවිසුම මගින් මෙම ගැටළුව නිමාවට පත් කරනු ලැබුණි. දෙපක්ෂයට ම ස්වාධීන අයිතියක් ලබාදෙමින් 1976 මාර්තු 23 වන දින අත්සන් තැබූ ගිවිසුමෙන් මන්නාරම් බොක්ක ආශ්‍රිත කලාපයේ සිට බෙංගාල බොක්ක දක්වා කලාපය ආර්ථික කලාපයක් බවට පත් කළේ ය (Kodikara, 1982, 32).

මෙලෙස කරුණු විමසන විට ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ගැටුමක් නොතිබුණේ යැයි මතුපිටින් පෙනී යන නමුත් යථාර්ථය වූයේ නිදහස් ලංකාවේ ආරක්ෂාව තුළ අඛණ්ඩ ගැටළුව වූ ඉන්දියාව හසුරුවන්නේ කෙසේ ද යන පැනයට ඉතා උපක්‍රමශීලී ලෙස බණ්ඩාරනායක මැතිනිය පිළිතුරු දුන් බව යි. ඉන්දියාව කලාපීය බලවතෙකු ලෙස මේ වන විට ශීඝ්‍රයෙන් බලය විදාරණය කරගෙන සිටි නිසා යෝධ අසල්වැසියාගේ බල සමතුලනයට ලංකාවට කලාපීය නොවන බලවතෙකුගේ සහය අවශ්‍ය විය. බණ්ඩාරනායක මැතිනිය මෙම බල තුලනය සඳහා තෝරාගත්තේ චීනය යි. චීනය සමඟ විවිධ සම්බන්ධතා පවත්වාගැනීමෙන් ඇය ඉන්දියාව කෙරෙහි ලංකාවේ රඳ පැවැත්ම දුර්වල කළා ය.

ඉන්දියාවට එරෙහි ව බණ්ඩාරනායක මැතිනිය ක්‍රියාත්මක වූ අනික් අවස්ථාව නම් ඉන්දියන් සාගර සාම කලාපීය යෝජනාව ගෙන ඒම යි. ඇය මීට මුල්ගල තැබුවේ නොබැඳි ජාතීන්ගේ සමුළු හරහා යි. මෙම නොබැඳි සමුළු තුළ ලංකාව රාජ්‍යයන්ගේ ආරක්ෂාව හා සාගරයේ නිදහස අතර සබඳතාව ගැන වඩාත් සංවේදී විය (Non-aligend conference:Basic documents 1961-1975, 1970: 7-8) එක් අතෙකින් ඉන්දියාව සමඟ සහයෝගීතාව තහවුරුකර ගනිද්දී අනික් අතින් ඉන්දියාවේ ඒ ඔස්සේ ම න්‍යෂ්ටික අත්හදාබැලීම්වලට විරුද්ධ ව ක්‍රියාකාරී වීමට යෝජනා ගෙන ආවා ය. 1970 දී පැවැත් වූ ලුසාකා සමුළුව තුළ දී අවි තරඟය අවසන් කොට නිරායුද බව දිනීම යන්නෙන් ඈ අදහස් කළේ සීතල යුද්ධ තත්ත්වය වුවත් වක්‍ර ව ඉන්දියාවේ අවි සඳහා ද සීමාවක් පැනවීම යි. ඉන්දියන් සාගරය න්‍යෂ්ටික අවි මුක්ත කලාපයක් බවට පත් කිරීමට යෝජනා කිරීම මගින් ඇය සීමා කිරීමට තැත් කළේ සුපිරි බලවතුන්ගේ අවි තරඟවලට වඩා ඉන්දියාවේ න්‍යෂ්ටික කටයුතු යි. 1976 දී කොළඹ පැවැත් වූ නොබැඳි සමුළුවෙන් ඉන්දියන් සාගරයේ න්‍යෂ්ටික අවි මුක්ත කලාපයක් බවට පත්කිරීම කඩිනම් කළ යුතු බවට යෝජනා කෙරිණි. 1971 දී මෙම යෝජනාව එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කිරීමට ඉන්දියාව ශ්‍රී ලංකාවට සහය දුනි.

නමුත් මෙම සාම කලාපය මගින් තම න්‍යෂ්ටික අත්හදා බැලීම්වලට බලපෑමක් එල්ලවන බව දුටු ඉන්දියාව එම යෝජනාවේ අවාසි සහගත අංග වෙනස් කිරීම සඳහා හැකි සෑම උත්සාහයක් ම ගත්තා ය. ගාමිණී කීරවැල්ල පෙන්වාදෙන පරිදි මෙම යෝජනාව තුළ මත දෙකක් ඉස්මතු විය ( Keerawalla, 1990 :175).

1. ශ්‍රී ලංකාව නියෝජනය කළ මතයට අනුව එය නාවුක තලවලට හා කටයුතුවලට පමණක් නොව සමස්ත ගොඩබිම් කලාපයට ම විෂය වූ පුළුල් දෙයක් විය.

2. ඉන්දියාව නියෝජනය කළ මතය තුළ සාම කලාපය කලාපයෙන් පිටට ඉලක්ක විය යුතු බවත් එය කලාපීය නොවන සුපිරි බලයන් සඳහා විය යුතු බව දැක්වීම.

මෙම ශ්‍රී ලංකා ඉන්දීය මතභේදය සැලකිල්ලට ගනිමින් ෂර්ලි අමරසිංහ පැවසුවේ යෝජනාව අර්බුදකාරී වෙනසකට බඳුන් වූ බව යි. යෝජනාවේ යහපත් අයහපත් අංග සලකා බැලීම සඳහා ඇඩ්හෝර්ක් කමිටුවක් පත් කෙරිණි (Keerawalla, 1991: 5-8). මෙලෙස කලාපීය සාගර බද රටවල් සාගරයේ නිදහසට බාධා කිරීම මගින් නාවික කටයුතු ආදිය අක්‍රමවත් විය හැකි බව කමිටුව ඉදිරියේ ඉස්මතු වූ එක කරුණක් විය. ලෝක මට්ටමේ සාමය සහ එකඟතාව ඇති නොකර කලාපයකට පමණක් එය සීමා කිරීම සිදු කළ නොහැකි බව ඉදිරිපත් වූ තවත් තර්කයක් විය. එසේම සාම කලාපීය යෝජනාව සංකල්පීය වශයෙන් නිශ්චිත නොවූ අතර ප්‍රායෝගික බවේ ද දුර්වලතාවක් විය. මේ ආදී කරුණු රැසක් නිසා සාම කලාපීය යෝජනාව බිඳ වැටුණු අතර එයට දැඩි බලපෑමක් එල්ල කළ ඉන්දියාවේ ක්‍රියා කලාපය බිඳ වැටීමට එක් හේතුවක් විය. ඉන්දියාව ඍජු ව ම විරෝධතාව නොදක්වා යෝජනාව තම ආරක්ෂක උපාය මාර්ග සමඟ අනුකූල වන පරිදි යොදාගනිමින් එය වෙනස් කළේ ය. මේ හරහා පාකිස්ථානයේ

න්‍යෂ්ටික බලය දුර්වල කිරීම ඉන්දියාවේ අධ්‍යාශය විය. මෙලෙස 1970-1977 අවධියේ ලංකාවේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ ඉන්දියාවේ යළිත් ප්‍රධාන භූමිකාව බවට පත් වූවා ය.

## නිගමනය

1948-1977 දක්වා ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ ඉන්දියානු භූමිකාව ක්‍රියාත්මක වූ ආකාරය විමසා බැලීමේ දී අවසානයේ නිගමනය කළ හැක්කේ එම යුගයේ ජාතික ආරක්ෂාවේ පොදු හඳුනාගැනීමක් ලෙස ඉන්දියාව සමඟ කටයුතු කිරීමේ අවිනිශ්චිතභාවය දැකිය හැකි බව යි. නිදහස් ලංකාවේ රාජ්‍ය නායකයෝ තම යෝධ අසල්වැසියාගේ බලපෑම කෙරෙහි නිතර ම සංවේදී වූ අතර ස්වාධීන ආරක්ෂක ප්‍රතිපත්තියකට එල්ලවිය හැකි ප්‍රබල ම බාධකය එය ලෙස හඳුනා ගත්හ. 1948- 1956 දක්වා එ. ජා. ප. රජයන් බලය දැරූ අවධියේ දී මෙම ඊනියා ඉන්දියානු භීතිය මගින් රහස් පක්ෂපාතිකම් ඔස්සේ බ්‍රිතාන්‍යයන් හා එළඹුණු ඇතැම් තීරණ සාධාරණීකරණය කර ගත්තේ ය. නමුත් ඔවුහු ක්‍රියාකාරී ලෙස ඉන්දියාව සමඟ එදිරිවාදිකම්වලට නො ගියහ. ඒ වෙනුවට සැමවිට ම ඉන්දියාව සමීප මිතුරා ලෙස සැලකීම වර්ධනය කළාය. නමුත් 1956 න් පසු තත්ත්වය වෙනස් වූ අතර බණ්ඩාරනායක මැතිනියගේ සමය වන විට මතුපිටින් නොපෙන්වූ නමුත් රජය ක්‍රියාකාරී ලෙසින් ඉන්දියාව හසුරවමින් ඉතා උපායශීලී මිත්‍රත්වයක් පවත්වා ගත්තේ ය. මේ සමස්ත අවධියේ ම ඉන්දියාව ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව ගොඩනැඟීමේ දැවැන්ත ගැටළුව බවට පත්වී තිබුණෙන් ඉන්දියාව හසුරුවන්නේ කෙසේ ද යන පැනයට ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය තුළ අඛණ්ඩ ව පිළිතුරු සෙවිණි. 1977 න් පසු ඊළාම් අරගලය සමඟින් ශ්‍රී ලංකාවේ යුද උපාය මාර්ග තීරකයින් මුහුණ දුන් දැවැන්ත ගැටළුවක් ලෙස ලංකාවේ සිවිල් යුද්ධයට ඉන්දියාවේ මැදිහත් වීම හැඳින්විය හැකි වන අතර මෙලෙස ඉන්දියාව ලංකාවේ පසු විජිත රාජ්‍ය සැකැස්ම තුළ වැදගත් ම බාහිර බලය විය.

## පරිශීලිත මූලාශ්‍රයෝ


Brissendon, R. (1962) 'India, Neutralism and SEATO', (ed.) George Modelski, SEATO-Six Studies, Melbourne: F.W. Chesire.

Ceylon Daily news , 23 Aprial (1956).

Hansard's, House of Representatives of Ceylon (1948-1977).

Holsti, K.J. (1983) International Politics A Framework for Analysis, New Jersey: Englewood Cliffs, N.J: prentice- Hall Inc.

Jayasekara, P.V.J. (1992) 'Indo-Sri Lanka Relations: The security Dimension', Security Dilemma of a small state part I, Sri Lanka in the south Asian context, (ed.) P.V.J. Jayasekara, New Delhi: South Asia Publication Pvt. Ltd.

Jennings, I. (1956) Crown and Commonwealth in Asia, London: International Affairs.

Keerawalla, G. (1991) 'The Fading Away of the Indian Ocean Peace Zone Proposal at the UN: some Ante- mortem Epitaphic Notes' Indian ocean Center for peace studies IPCPS Briefing paper no one, papers presented at India: prospect for Future

Keerawalla, G. (2008) Evolving security discourse in Sri Lanka from National Security to Human security, Bangladesh : Institute of International and Strategic studies.

Keerawalla, G.B. (1990) 'Peace and Security perceptions of a small state: Sri Lankan Responses to Super Power Naval rivalry in Indian ocean 1970-77', South Asian strategic Issues, Sri Lankan perspectives, (ed.) S.U. Kodikara, New Delhi: Sage Publications.

Keerawella. G. (1992) 'The Rise of India as a Regional Power: The military Dimension' Security Dilemma of a small state. Pt-1 Sri Lanka in the south Asian context, (ed.) P.V.J. Jayasekara, New Delhi: South Asian Publishers (Pvt.) Ltd.

Kodikara, S.U. (1982) Foreign Policy of Sri Lanka-A Third World Perspective, New Delhi: Chanakya Publications.

Mendis, V.L.B. (1983) Foreign Relations of Sri Lanka from earlist time to 1965, Dehiwela: Tisara Prakasakayo Ltd.

Non-aligend conference (1970) Basic documents (1961-1975) Colombo, Bandaranaike Center for International studies.

Panikkar, K.M. (1945) India and the Indian Ocean, London: George Allen and Unwin.

Phadnis, U. (1992) 'The 1964 Indo-Ceylon pact and the stateless persons in Ceylon', India's Neighbors and Foreign policy, (ed.) Verinder Grover, New Delhi: Deep and Deep Publications.

Prasad, D.M. (1973) Ceylon's Foreign Policy under the Bandaranaike's (1956-65) a political Analysis, New Delhi: S. Chand & Co. (Pvt.) Ltd.

Study group of the Indian Council of World affairs (ed.), (1958) Defence and Security in the Indian Ocen area, Bombay: Asian Publishing house.

Wriggins, W.H. (1962) Ceylon Dilemmas of a new nation, Princeton: The University Press.